
# Sinhala Quotes of Mahatma Gandhi






## සත්‍යය....(මොහොතක් සිතන්න)

සත්‍යයට වඩා උසස් දෙවියෙකු, මේ විශ්වයේ නොමැත.

- මහත්මා ගාන්ධි තුමන් -




ආදරය.... (මොහොතක් සිතන්න)
ආදරය හඳුනා ගැනීම හා ඉගෙන ගැනීම කල හැක්කේ කුඩා දරුවන් තුලින්මය.
- මහත්මා ගාන්ධි තුමන් -

## මිත්‍රත්වය.... (මොහොතක් සිතන්න)

නිවැරදි දේ හඳුනන සතුරා සමග සැම විටම මිතුරු වන්න.

- මහත්මා ගාන්ධි තුමන් -



## ආත්ම අභිමානය.... (මොහොතක් සිතන්න)


අප විසින්ම ලබා දුන්නොත් මිස, ඔවුනට අපේ ආත්ම අභිමානය උදුරා ගැනීමට නොහැකිය.


- මහත්මා ගාන්ධි තුමන් -




උසස් බව.... (මොහොතක් සිතන්න)
ජාතියක උසස් බව සහ සදාචාරාත්මක දියුණුව මැනිය හැක්කේ, එම රටේ ජනතාව සත්වයින් හට සලකන ආකාරයෙනි.
- මහත්මා ගාන්ධි තුමන් -


විශ්වාසය.... (මොහොතක් සිතන්න)
ඔබේ විශ්වාසය හේතුවක් මත ගොඩ නගා ගන්න. නැතහොත්
එම විශ්වාසය දිනක ඔබ වෙතින්ම ඉවත්ව යනු ඇත.
- මහත්මා ගාන්ධි තුමන් -


මනස.... (මොහොතක් සිතන්න)
ඔබට මා හට විලංගු දැමිය හැක, වධ හිංසා කල හැක, අවශ්‍ය නම් මගේ මේ ශරීරයෙන් මේ ජීවයද උදුරා ගත හැක. නමුත්, ඔබට කිසිදා මගේ මනස සිර කල නොහැක.
- මහත්මා ගාන්ධි තුමන් -


අවිහිංසාව.... (මොහොතක් සිතන්න)
අවිහිංසාව යනු ශක්තිමත් බවේ ආයුධයයි.
- මහත්මා ගාන්ධි තුමන් -


අවසරය.... (මොහොතක් සිතන්න)
ලොව සිටින කිසිම කෙනෙකු හට, ඔබේ අවසරයකින් තොරව
ඔබට රිදවිය නොහැක.
- මහත්මා ගාන්ධි තුමන් -



ප්‍රතිවාදියා.... (මොහොතක් සිතන්න)
ඔබගේ ඉදිරියේ ඔබේ ප්‍රතිවාදියා සිටි නම්. ඔහුව මිත්‍රත්වයෙන්
හා ආදරයෙන්, යටත් කර ගන්න.
- මහත්මා ගාන්ධි තුමන් -

## ජයග්‍රහණය හා පරාජය.... (මොහොතක් සිතන්න)

ප්‍රචණ්ඩත්වය තුලින් ලබා ගත් ජයග්‍රහණය හා පරාජය අතර වෙනසක් නොමැත. මක් නිසාද, එම ලැබූ ජයග්‍රහණය පවතින්නේ සුළු මොහොතක් බැවිනි.

- මහත්මා ගාන්ධි තුමන් -






මනුෂ්‍යත්වය.... (මොහොතක් සිතන්න)
මනුෂ්‍යත්වය පිළිබඳ විශ්වාසය නැති කර නොගන්න. මන්ද යත්, මනුෂ්‍යත්වය නැමැති සාගරයට අපිරිසිඳු දිය බිංදු කිහිපයක් එකතු වුවද, එහි පාරිශුද්දත්වයට කිසිඳු හානියක් කල නොහැකි බැවිනි.
- මහත්මා ගාන්ධි තුමන් -

## සමාව දීම.... (මොහොතක් සිතන්න)

දුර්වලයෙකුට, අන් අයට සමාව දීමට නොහැක. මක් නිසාද, සමාව දිම, ශක්තිමත් අයෙකුට පමණක් කලහැක්කක් නිසා ය.

- මහත්මා ගාන්ධි තුමන් -





ආත්ම විශ්වාසය.... (මොහොතක් සිතන්න)
මිනිසෙක් ශක්තිමත් වන්නේ තම ශරීරයෙන් නොව, ඔහු තුළ පවත්නා වූ ස්ථිර ආත්ම විශ්වාසයෙනි.
- මහත්මා ගාන්ධි තුමන් -

## ප්‍රචණ්ඩත්වය.... (මොහොතක් සිතන්න)

මම තරයේ ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කරමි. මන්ද යත්, එයින් සිදු කරන යහපත තාවකාලික වන අතර සිදුවන විපත සදාකාලික වන හෙයිනි.

- මහත්මා ගාන්ධි තුමන් -

## වරදට වෛරය.... (මොහොතක් සිතන්න)



වරදට වෛර කරන්න, නමුත් වැරදි කරන්නාට ආදරය කරන්න.

- මහත්මා ගාන්ධි තුමන් -

# මිනිසා.... (මොහොතක් සිතන්න)

මිනිසුන් වර්ග දෙකක් සිටින බව මගේ පියා මට පවසා ඇත.

ඉන් එක් කොටසක් වැඩ කරන අයයි. අනෙක් කොටස එ සඳහා ලකුණු දමා ගන්නා අයයි.

මගේ පියා මට නිතර උපදෙස් දී ඇත්තේ මින් පළමු කොටසට වී සිටින ලෙසයි.

එයට හේතුව වැඩ කරන මිනිසුන් අතරේ තරඟයක් නොමැති අතර තරඟය ඇත්තේ වැඩ නොකර ලකුණු දමා ගන්නා මිනිසුන් අතරේ බැවිනි.

- මහත්මා ගාන්ධි තුමන් -